රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක - 7/2007(1)

මගේ අංකය - ආ/2/3/2/70
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2007.08.29 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.</u>

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මැයෙන් 2007.05.28 දනමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

02 එහි 1 (ඇ) ජේදය අනුව ඇමුණුමෙහි ඇතුලත් නොවූ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන තනතුරු වල නිලධාරීන් විසින් ලබා ගත යුතු භාෂා ප්‍රවීනතා මට්ටම (සේවයට බැදුනු සේවා භාෂාවට අන්‍ය වූ රාජ්‍ය භාෂා ප්‍රවීනතා මට්ටම) තීරණය කිරීම සඳහා මේ සමග අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කර නොපමාව ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කරුණාවෙන් ඉල්ලමි.

03. මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන සංග්‍රහයේ II පරිච්ජේදයේ 12:11:1 උප වගන්තියට අනතුරුව පහත සඳහන් උපවගන්තිය ඇතුලත් කරනු ලැබේ.

> " 12:11:2 සෑම නිලධාරියකුම සේවයට/තනතුරට පත්වී වසර 5 ක් තුල අදල තනතුරට නියම කර ඇති දෙවෙනි රාජ්‍ය භාෂා ප්‍රවීනතාව (තනතුරට නියමිත මට්ටම) ලබා ගත යුතුය. නියමිත කාලය තුල ප්‍රවීනතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය වේ"

04. රාජ්‍ය සේවයේ සියලුම සේවා ව්‍යවස්ථා සහ බඳවාගැනීමේ පරිපාටිවල මෙම විධිවිධාන ඇතුලත් කරමින් සංශෝධනය කල යුතුය. ඒ අනුව සේවා ව්‍යවස්ථාවල දැනට පවත්නා විධි විධාන සහ බඳවාගැනීමේ පරිපාටි වල සේවා කොන්දේසි යටතේ ඉහත 3 වන ජේදයේ සඳහන් විධිවිධාන ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු යොදන්නේනම් මැනවි.

05. 2007.07.01 දින සිට ලබා දෙනු ලබන සියලු පත්වීම් ලිපි වල මෙම විධිවිධාන ඇතුලත් කිරීමටද (මුල් චක්‍රලේඛයේ 4 වන ජේදය බලන්න) කටයුතු කල යුතුය.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පිටපත - සභාපති
රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

(මෙම ආකෘතිය පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කරන්න.)

මගේ අංකය -
ඔබේ අංකය -
...............................
...............................
...............................
2007......................

ආයතන අධ්‍යක්ෂ ජනරාල්

<u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම</u>

2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 අනුව මෙම අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ ඇති පහත සඳහන් තනතුරු සඳහා අදාල විය යුතු දෙවෙනි භාෂා ප්‍රවීනතා මට්ටම් තිරණය කර මා වෙත දැනුම් දෙන මෙන් ඉල්ලමි.

| අනු අංකය 1 | තනතුරු නාමය 2 | බඳවාගැනීමේ පරිපාටිය/සේවා ව්‍යවස්ථාව යොමු අංකය 3 | දෙපාර්තමේන්තු ප්‍රධානියා/අමාත්‍යාංශ ලේකම් නිර්දේශ කරන ප්‍රවීනතා මට්ටම 4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන ප්‍රවීනතා මට්ටම 5 |
|---|---|---|---|---|
| | | | | |

............................................................
අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා

---

මගේ අංකය -
ඔබේ අංකය -
2007................

.......................................
.......................................

<u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම</u>

ඔබගේ 2007..........මස ..... දිනැති ලිපිය පිළිබඳවයි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 යටතේ එහි සඳහන් තනතුරු සඳහා අදල විය යුතු දෙවෙනි රාජ්‍ය භාෂා ප්‍රවීනතා මට්ටම ඉහත උප ලේඛණයේ 5 වන තීරුවේ සඳහන් පරිදි විය යුතු බව දන්වනු කැමැත්තෙමි.

ආයතන අධ්‍යක්ෂ ජනරාල්